දෙහිවල පොලිස් බල ප්‍රදේශයේ පිහිටි ට්‍රාන්ස්ෆෝමරයක් සහිත විදුලි රැහැන් කණුවක තඹ කම්බි සොරකම් කිරීමට ගිය බවට පැවසෙන අයෙකු විදුලි සැර වැදී මරණයට පත් වූ පුවත, දිනමිණ සහ අරුණ පුවත්පත් තුළ මෙසේ වාර්තා වී තිබිණි.

* දිනමිණ - "තඹ කම්බි හොරකමේ ගිය කුඩ්ඩා වොට් තිස්තුන්දාහක් වැදී මරුට" (පුවත් අන්තර්ගතය තුළ අදාළ අය මතට ඇබ්බැහි වූ අයෙකු බවක් සඳහන් කර නැත.)

* අරුණ - "ට්‍රාන්ස්ෆෝමරයේ තඹ කම්බි කපන්න ගිහින් කරන්ට් වැදී මරුට"

* දිනමිණ හා අරුණ පුවත් දෙකම සමඟ, එම මියගිය අය විදුලි රැහැන් කණුව මත විදුලි සැර වැදී සිටින ඡායාරූපයක් පළ කර ඇත.

1) අදාළ පුවත් වාර්තාව තුළ මියගිය පුද්ගලයා සහ මත්ද්‍රව්‍ය අතර කිසිදු සම්බන්ධතාවයක් නොදැක්වෙන්නේ නම්, සිරස්තලය තුළ පමණක් එම මිය ගිය අය "කුඩ්ඩෙකු" වී ඇත්තේ කෙසේද?

2) බොහෝ විට පුවත් වාර්තාවන්ට සිරස්තල යොදන්නේ එම පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොව පුවත්පත් කර්තෘවරයෙකු බව මාධ්‍යවේදීන් විසින් අපට පෙන්වා දී ඇති කරුණකි. එසේ නම්, සිරස්තලය තුළ පමණක් මිය ගිය අය "කුඩ්ඩෙකු" ලෙස සඳහන් කර ඇත්තේ මන්ද?

3) පුවත් සිරස්තලය තුළ "කුඩ්ඩා" යනුවෙන් සඳහන් වීම ඔස්සේ, එම යෙදුම සමඟ බැඳී ඇති ගර්හාත්මක සහ නිශේධනාත්මක අර්ථය සමගින්, ඔවුන්ට සමාජයෙන් එල්ලවන කොන්කිරීම තවත් තීව්‍ර නොවන්නේද?

4) යම් අයෙකුට නැරඹීමට අපහසු විය හැකි සංවේදී ඡායාරූපයක් පළ කිරීම මෙම පුවත් වාර්තාවට අවශ්‍යද?

